# SOUTH ASIA PROGRAM

## කෝර්නේල් විශ්වවිද්‍යාලයෙහි සිංහල

### දකුණු ආසියාතික අධ්‍යයනය සඳහා ලොව පිළිගත් මධ්‍යස්ථානයක සුවිශේෂී වැඩසටහනකි

- කෝර්නේල් විශ්වවිද්‍යාලයේ, දකුණු ආසියාතික වැඩසටහන, දකුණු ආසියාව පිළිබඳ පර්යේෂණ සහ ඉගැන්වීම මෙන්ම ආචාර්යවරු හා සිසුන් සඳහා සහාය වන අන්තර් විෂයික මධ්‍යස්ථානයකි.

- ශ්‍රී ලංකා අධ්‍යයනය1960 සිට කෝර්නේල් විශ්වවිද්‍යාලය තුළ ස්ථාපනය වී තිබෙන අතර කෝර්නේල් විශ්වවිද්‍යාලයේ පීඨ හා වෘත්තීය අධ්‍යයන පීඨ කිහිපයක ආචාර්යවරුන් විවිධ වූ විෂය ක්ෂේත්‍ර මගින් සම්බන්ධ කෙරෙයි.

- කෝර්නේල් විශ්වවිද්‍යාලයේ Kroch ආසියාතික පුස්තකාලයෙහි ශ්‍රී ලංකාවට අදාළව සිංහල, දෙමළ, පාලි හා සංස්කෘත යන භාෂාවලින් ලියැවුණු ලෝක මට්ටමේ අති විශාල ප්‍රමාණයේ කෘති එකතුවක් පවත්වාගෙන යනු ලැබෙයි.

- කෝර්නේල් විශ්වවිද්‍යාලය මගින් සිංහල පිළිබඳ පූර්ණ විෂය මාලාවක් අධ්‍යයන වර්ෂය පුරා පවත්වාගෙන යනු ලැබෙන අතර එලෙස ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යයන වර්ෂය පුරා සිංහල විෂය ඉගැන්වෙන ලොව එකම විශ්වවිද්‍යාලයද වෙයි. සිංහල භාෂාව ඉගැන්වීමේ පාඨ ග්‍රන්ථ සකස්කිරීමේ ගෝලීය ප්‍රමුඛයාද වෙයි.

- කෝර්නේල් සිංහල භාෂා වැඩසටහන මහාචාර්ය ජේම්ස් ගෙයර් (D. L. සාහිත්‍ය චක්‍රවර්ති කැලණිය විශ්වවිද්‍යාලය, Ph.D. කෝනල් විශ්වවිද්‍යාලය) විසින් ස්ථාපිත කරන ලදී.

- කැළණිය විශ්වවිද්‍යාලයේ වාග් විද්‍යා අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක මහතා කෝර්නේල් විශ්වවිද්‍යාලයේ සිංහල භාෂා වැඩසටහන සැකසීම, ඉගැන්වීම සහ පාඨ ග්‍රන්ථ සංවර්ධනය කිරීම සඳහා මහාචාර්ය ගෙයර් සමග ඉතා සමීපව කටයුතු කොට තිබේ.

# SOUTH ASIA PROGRAM

**වටිනාකමකින් යුතු භාෂාවක්**

කෝර්නේල් විශ්වවිද්‍යාලය තුළ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සිසුන් ඇතුළු උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් විසින් සිංහල භාෂා පාඨමාලා මෙන්ම, සංස්කෘතිය, සිංහල සාහිත්‍ය, ආගම, ඉතිහාසය, පාරිසරික අධ්‍යයන පාඨමාලා සහ ශ්‍රී ලංකා සමාජය පිළිබඳ පාඨමාලාද හදාරනු ලැබෙයි.

**සිංහල යනු:**

- ලෝකයේ එක් විශේෂිත භාෂාවකි
- ගැඹුරු සාහිත්‍යයික හා සාංස්කෘතික උරුමයන් හා බැඳී පවතී
- ශ්‍රී ලාංකික ප්‍රජාව සහ ශ්‍රී ලංකාව මෙන්ම අතීතය හා වර්තමානය පිළිබඳ අධ්‍යයනයන්ට මූලය වෙයි

**කෝර්නේල් විශ්වවිද්‍යාලයීය සිංහල ප්‍රකාශන**

කථා ව්‍යවහාර සිංහල (ෆෙයාබෑන්ක්ස්, ගෙයර් සහ ද සිල්වා 1968, 1981), සාහිත්‍යයික සිංහල (1974), කථා ව්‍යවහාර සිංහල කියවීම (ගෙයර් , කරුණාතිලක, සහ Paolillo), මූලික කියවීම සහ සිංහල අකාරාදිය (බණ්ඩාර හේරත් 2011), මූලික කියවීම සහ ලේඛන පරිචය (බණ්ඩාර හේරත් 2011) මූලික කථා ව්‍යවහාර සිංහල (T. McGarry සහ ඒ. ලියනගේ 2011), මූලික සිංහල ව්‍යාකරණ අත්පොත (බණ්ඩාර හේරත් 2015), ද්විතීයික සිංහල කියවීම (බණ්ඩාර හේරත් 2015)

For more information contact: Anne M. Blackburn, Director, Cornell South Asia Program: amb242@cornell.edu, 607 255-8923 and Bandara Herath, Lecturer in Sinhala: 607.220.7672.